# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ශ්‍රේෂ්ඨාධිකරණයේ දී

**ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 126 වන ව්‍යවස්ථාව යටතේ අයැදුමෙහි වන කරුණ පිළිබඳවයි.**

**වාසුදේව නානායක්කාර**
**නීතිඥ**
**අතිගරු ජනාධිපති උපදේශක**
**ලේකම්, ප්‍රජාතන්ත්‍රවාදී වාමාංශික පෙරමුණ**
**49 1/1, විනයාලංකාර මාවත**
**කොළඹ 10**

**එස්සීඑෆ්ආර් ඉල්ලුම්පත් අංක. 209/2007** **පෙත්සම්කරු**

**එදිරිව**

1. කේ. එන්. චොක්සි, සාම විනිසුරු, පා.ම.
   හිටපු මුදල් අමාත්‍ය
   23/3, ශ්‍රීමත් අර්නස්ට් ද සිල්වා මාවත
   කොළඹ 7.

2. කරු ජයසූරිය, පා.ම.
   හිටපු විදුලිබල හා බලශක්ති අමාත්‍ය
   2, අමරසේකර මාවත
   කොළඹ 5

3. රනිල් වික්‍රමසිංහ, පා.ම.
   හිටපු අග්‍රාමාත්‍ය
   115, 5 වන පටුගම
   කොළඹ 3

4. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරතුංග
   ශ්‍රී ලංකා හිටපු ජනාධිපති
   හොරගොල්ල වලව්ව
   හොරගොල්ල

5. මිලින්ද මොරගොඩ, පා.ම.
   ආර්ථික ප්‍රතිසංස්කරණ හිටපු අමාත්‍ය
   3/2, ඇලන් මැතිණියාරාම පාර
   කොළඹ 5

6. ශ්‍රීපති සූරියාරච්චි, නීතිඥ, පා.ම.
   රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ හිටපු අමාත්‍ය
   22, නිවාස මාවත
   රිලවුල්ල
   කදාන

7. චරිත රත්වත්ත
   හිටපු භාණ්ඩාගාර ලේකම්
   16, ජාවත්ත පාර
   කොළඹ 5

8. පී. බී. ජයසුන්දර
   භාණ්ඩාගාර ලේකම් / හිටපු සභාපති,
   රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්)
   (PERC)
   ලේකම් කාර්යාලය
   කොළඹ 1

9. පී. වීරහැන්දි
   හිටපු ලේකම්
   විදුලිබල හා බලශක්ති අමාත්‍ය
   410/7, බෞද්ධාලෝක මාවත
   කොළඹ 7

10. දහම් විමලසේන
    හිටපු සභාපති
    ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
    සාමාජික, තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC)
    22/11, සුභද්‍ර මාවත
    මාදිවෙල

11. උපාලි දහනායක
    හිටපු අධ්‍යක්ෂ, මුදල් අමාත්‍යාංශය
    සාමාජික, තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC)
    32, පිරිස් මාවත, ඉඩම
    මොරටුව

12. ඒ.ඩබ්.සී.පෙරේරා
    හිටපු අතිරේක ලේකම්
    ආර්ථික ප්‍රතිසංස්කරණ අමාත්‍යාංශය
    සාමාජික, තාක්ෂණික ඇගයීම් කමිටුව (TEC)
    57/2, රජමහ විහාර පාර
    පිටකෝට්ටේ

13. ශ්‍යාමලී ගුණවර්ධන
    නීතිඥ
    හිටපු අධ්‍යක්ෂ නීති,
    රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්)
    500/111, තිඹිරිගස් යාය පාර
    කොළඹ 5

14. ඩීඑෆ්සීසී බැංකුව
    73/5, ගාලු පාර
    කොළඹ 3

15. ඉඩම් කොමසාරිස්
    ඉඩම් කොමසාරිස් දෙපාර්තමේන්තුව
    7,ග්‍රෙගරි මාවත
    කොලඹ 7

16. ශ්‍රී ලංකා වරාය අධිකාරිය
    19, පල්ලිය මාවත
    කොළඹ 1

17. ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව
    109, රොටුන්ඩා කුළුණ
    ගාලු පාර
    කොළඹ 3

18. ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමාගම
130, ග්ලෙනී මාවත
කොළඹ 2

19. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL)
69, වොල්ස් පටුමග
කොළඹ 15

20. සුසන්ත රත්නායක
සභාපති
ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමාගම
130, ග්ලෙනී මාවත
කොළඹ 2

21. වී. ලින්තොටවෙල
හිටපු සභාපති
ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් සමාගම
55, අබ්දුල් කෆූර් මාවත
කොළඹ 3

22. නිහාල් ශ්‍රී අමරසේකර
හිටපු සභාපති,
රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්)
167/4, විපුලසේන මාවත
කොළඹ 10

23. ඩබ්. එම්. බන්දුසේන
හිටපු සභාපති,
රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්)
එක්ස් බී /1/2/2, එඩ්මන්ටන් නිවාස
කිරුලපන
කොළඹ 5

24. ඩබ්. ඒ. එස්. පෙරේරා
සභාපති,
රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්)
බටහිර කුළුණ, 11 වන මහල
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
එචිලන් චතුරශ්‍රය
කොළඹ 1

25. චන්න ද සිල්වා
අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
(SEC), මහල 11-01, නැගෙනහිර කුළුණ
ලෝක වෙළඳ මධ්‍යස්ථානය
එචිලන් චතුරශ්‍රය
කොළඹ 1

26. ලලිත් වීරතුංග
අතිගරු ජනාධිපති ලේකම්
ජනාධිපති ලේකම් කාර්යාලය
කොළඹ 1

27. විජේදාස රාජපක්ෂ, සාම විනිසුරු, පා.ම.
සභාපති,
පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව
(කෝප්) (COPE)
17, විජේබා මාවත
හරස් නාවල පාර
නුගේගොඩ

28. පොලිස්පති
පොලිස් මූලස්ථානය
කොළඹ 1

29. නියෝජ්‍ය පොලිස්පති
අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව
4 වන මහල, නව මහ ලේකම් කාර්යාලය ගොඩනැගිල්ල
කොළඹ 1

30. සභාපති
අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාව
36, මලලසේකර මාවත
කොළඹ 7

31. ගරු. නීතිපති
නීතිපති දෙපාර්තමේන්තුව
කොළඹ 12

**වගඋත්තරකරුවන්**

**වෙත: ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ උත්තරීතර ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරු සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ අනෙකුත් ගරු විනිසුරුවරුන්**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පුරවැසියකු වන කොළඹ 10, විපුලසේන මාවත, අංක 167/4 පදිංචි නිහාල් ශ්‍රී අමරසේකර වන මම බෞද්ධාගමිකාරයකු වශයෙන්, අවංකවත්, සත්‍ය ලෙසත්, ගරු ගාම්භීරපූර්වකවත් පහත සඳහන් පරිදි ප්‍රකාශ කර සිටින වග නම්,

1. අ) ඉහත නම් සඳහන් ප්‍රතිඥා දෙන්නා සහ 22 වන වග උත්තරකරු මම වන අතර මගේ පෞද්ගලික දැනුම හා විශ්වාසය අනුව මෙහි මෙහි අඩංගු කරුණු සහ මෙහි සඳහන් ලිපි ලේඛන හා උපදෙස් නිවැරදි බවට ප්‍රකාශ කරමි.

ආ) පෙත්සම්කරුගේ 2007.06.28 දිනැති පෙත්සම සහ ඒ සමඟ වන ඔහුගේ සහාය දිවුරුම් ප්‍රකාශයක් හා සලකුණු කරනු ලැබූ ලේඛනයන්හි පිටපත් සමඟ ඔබගේ ගරු අධිකරණයෙන් මා වෙත නිකුත් කරනු ලැබූ දැන්වීම 2007.07.28 වන දින ලියාපදිංචි තැපෑලෙන් ලදිමි.

ඇ) මම 2004.5.24 දින සිට 2005.11.10 දින දක්වා රාජ්‍ය ව්‍යවසාය ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවේ (පර්ක්) සභාපති ලෙස කටයුතු කර ඇත.

ඈ) පෙත්සම්කරු විසින් ඉදිරිපත් කරන තර්කය සහ පෙත්සම්කරු විසින් ඔහුගේ පෙත්සමෙන් අයදින සහන ගරු අධිකරණය විසින් ප්‍රදානය කිරීම සම්බන්ධයෙන් මා එකඟ වන බව, මා ගෞරවයෙන් ප්‍රකාශ කර සිටිමි.

ඉ) පෙත්සම්කරුගේ පෙත්සමට ප්‍රතිචාර වශයෙන් මා පහත සඳහන් පරිදි ප්‍රකාශ කරමි.

2. අ) පෙත්සමෙහි ඡේද අංක 2 (ටී), 20(ඊ), 25(i)(ii), 30, 32(බී), 34 සහ 35 සම්ප්‍රකාශය සහ පෙත්සම සමඟ අමුණා ඇති දිවුරුම් ප්‍රකාශයෙහි අනුරූප සම්ප්‍රකාශයන් සහ පෙත්සම සමඟ ආවේශ්‍යා කර ගනු ලැබූ ලේඛනයෙහි **පි10(ඒ)**, **පි10(බී)**, **පි28(බී)**, **පි32** සහ **පි 34** මා පිළිගනිමි.

ආ) පෙත්සමෙහි 1, 2, 3, 4, 5, 6, 7, 8, 9, 10, 11, 12, 13, 14, 15, 16, 17, 18(ඒ), 19(බී), 20, 21, 22, 23, 24, 25, 26, 27, 28, 29, 31, 32(ඒ), 33 සහ 36 ඡේදයන්හි සම්ප්‍රකාශයන් සහ දිවුරුම ප්‍රකාශනයෙහි අනුරූප සම්ප්‍රකාශයන් සහ මෙහි පහත 2 (ඇ) ඡේදය යටත් වන එම කරුණු පිළිබඳ මා දැනුවත් වෙමි.

ඇ) පෙත්සමෙහි ඡේද 8(එෆ්), 18(බී), 18(සී), 18(ඩී) සහ 19(ඒ) හි වන සම්ප්‍රකාශයන් පිළිබඳව මා නියත වශයෙන්ම විශ්වාස කරමි.

ඇ) තවදුරටත් 32 (බී) ඡේදයට පිළිතුරු සපයමින්, අවශ්‍ය වූ බැවින් පොදු ව්‍යාපාර පිළිබඳ පාර්ලිමේන්තු කාරක සභාව (කෝප්) හමුවේ සාක්ෂි ලබා දුන් බවත්, ලිඛිත නියෝජනයන් ඉදිරිපත් කළ බවත් මා පිළිගනිමි.

3. ඔබගේ ගරු අධිකරණය හමුවේ විනිශ්චය කරන මෙම අයැදුමෙහි කරුණු සංක්ෂේපත්වයට අවශ්‍ය වනු ඇතැයි සැළකෙන, පහත වැඩිමනත් කරුණු ඔබගේ ගරු අධිකරණය හමුවේ ගෞරවයෙන් සමානයනය කරමි.

4. අ) පෙත්සම්කරු විසින් ඉදිරිපත් කර ඇති ගනුදෙනු, අමාත්‍ය මණ්ඩල ආර්ථික අනු කමිටුව සමඟ කටයුතු කරන ලද ඒවා වනු ඇති බව මම නියත වශයෙන්ම විශ්වාස කරමි.

ආ)අදාළ කාල වකවානුව තුළ අමාත්‍ය මණ්ඩල ආර්ථික අනු කමිටුවෙහි සටහන් මගින්, තර්ජනයක් ගන්නා තීන්දු තීරණ සහ එවැනි තීන්දු තීරණ කළ පුද්ගලයන් හෙළිදරව් කරනු ඇත.

ඇ)පෙත්සමෙහි ඡේද 18(ඒ) පරිශීලනය කළ 2002.8.15 දිනැති ලිපිය **(පි20)** එවකට අග්‍රාමාත්‍ය (තෙවන වගඋත්තරකාර) ගේ උපදේශක ආර්. පාස්කරලිංගම් වෙත පිටපත් කර ඇත.

5. අ) තවදුරටත් පෙත්සමෙහි ඡේද 25, 26, 27, 28, 29, 30 සහ 31 ට පිළිතුරු සපයමින්, එවකට රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්) හි සභාපති වශයෙන් සිටි මා, අ. 8 රූ. 2 පර්. 21.44පී දරණ බ්ලූමැන්ඩල් ඉඩම ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) වෙත පැවරීමේ අදහසින් ගනු ලැබූ පියවරයන් පිළිබඳ මුළුමනින්ම නොදන්නා බව, මා ප්‍රකාශ කර සිටිමි.

ආ) පෙත්සමෙහි සඳහන් කර ඇති පරිදි, පැවරීමට අදාළව එකී ඉඩම් දෙස බැලීමේදී එය දැනුවත් කිරීමකින් තොරව හොර රහසේ කරන ලද ක්‍රියාවක් බව, මා විසින් 2005.7.1 දිනැතිව **(පි32)** වෙනත් කරුණු අතර, (ජෝන් කීල්ස්) (18 වන වගඋත්තරකාර), ජෝන් කීල්ස් හෝල්ඩිංග්ස් ආයතනයේ එවකට සභාපති (21 වන වගඋත්තරකාර).., ආමන්ත්‍රණය කරනු ලැබූ ලිපියෙහි සඳහන් ය:

> "4. රුපියල් 1,200,000 / - ක මිලදී ගැනීම් සැළකීමේදී, ලබා ගත හැකි වාර්තා අනුව එය 'වට්ටම් මුදල් ප්‍රවාහ' යන පදනම මත ඩී.එෆ්.සී.සී. විසින් සිදු කර තිබූ තක්සේරු මත පදනම් වී ඇති බව: ඔබ සඳහන් කර ඇත. ලංකා මැරයින් සර්විස් ලිමිටඩ් වෙත මාරු කිරීමට එකඟ වූ බ්ලූමැන්ඩල් අ. 8 රූ. 2 ප 21.44 ඉඩමේ වෙළඳ පොළ වටිනාකම මෙම තක්සේරු කිරීමට ඇතුලත් කර තිබේද යන්න පිළිබඳ ඛනිජ තෙල් සංස්ථාවේ සභාපති විසින් අසන ලද ප්‍රශ්නයකට අනුව, ඒ සඳහා තීරණය කර ඇති වෙළෙඳ පොළ වටිනාකමට ඉඩමේ එවැනි ප්‍රමාණය ගණනයට ගෙන නොමැති බව අනාවරණය වී ඇත."

*ජෝන් කීල්ස් ආයතනයේ (18 වන වග උත්තරකාර) එවකට සභාපති (21 වන වගඋත්තරකාර) වෙත 2005.7.1 දිනැතිව යවනු ලැබූ එකී ලිපියේ සත්‍ය පිටපතක් ගරු අධිකරණයේ පහසුව සඳහා, 22ආර්(1) ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

6. අ) රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්) හි අධ්‍යක්ෂ ගේ 2005.7.1 දිනැති ලිපිය මගින්, මාගේ 2005.7.1 දිනැති එකී ලිපියද**((පි32)/(22ආර්(1))** භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර (8 වන වගඋත්තරකාර) ට එහි අන්තර්ගතය සංක්ෂිප්ත කරනු පිණිස රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වී. කණගසබාපදි වෙත යවනු ලැබ ඇත.

*2005.7.1 දිනැතිව යවනු ලැබූ එකී ලිපියේ සත්‍ය පිටපතක්, **22ආර්(2)** ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

ආ) 2005.7.1 දිනැති මගේ එකී ලිපියට **(පී32)/(22ආර්(1))** ජෝන් කීල්ස් ආයතනයේ (18 වන වගඋත්තරකාර එවකට සභාපති (21 වන වගඋත්තරකාර) විසින් 2005.7.4 දිනැතිව ප්‍රතිචාර දක්වා ඇති අතර, එහි පවා ඇති පරිදි, ඇත්තෙන්ම එම ඉඩම 2005.1.19 දින පැවරීම සිදු කිරීමට අරමුණු කර ඇති නමුදු, සැළකිය යුතු ලෙස සැක සහිත ලෙස යටපත් වී ඇත.

*2005.7.4 දිනැතිව ජෝන් කීල්ස් ආයතනයේ (18 වන වගඋත්තරකාර) එවකට සභාපති (21 වන වගඋත්තරකාර) විසින් යවනු ලැබූ එකී ලිපියේ සත්‍ය පිටපතක් , **22ආර්(3)** ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

ඇ) i) මාගේ 2005.7.1 දිනැති එකී ලිපිය **((පී32)/(22ආර්(1))**, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) විසින්ද ඔවුන්ගේ 2005.7.6 දිනැති ලිපිය මගින්, භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර (8 වන වගඋත්තරකාර) වෙත යවනු ලැබ ඇත.

ii) එවිට පවා, රාජ්‍ය ව්‍යාපාර ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව (පර්ක්) හි සාමාජිකයකුද වන භාණ්ඩාගාර ලේකම් පී. බී. ජයසුන්දර (8වන වගඋත්තරකාර), එකී ඉඩම 2005.1.19 දින ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL)(19 වන වගඋත්තරකාර) වෙත පැවරීමට අරමුණු කර ඇති බව මට හෝ පර්ක් ආයතනයට හෙළි කර නොමැත.

*2005.7.6 දිනැති එකී ලිපියේ සත්‍ය පිටපතක් , **22ආර්(4)** ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

ඇ) ඉන් අනතුරුව, පර්ක් සභාපති වශයෙන් මගේ ඉල්ලා අස්වීමට කෙටි කලකට පෙර, එහි සත්‍යතාවය පර්ක් කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකු විසින් මගේ අවධානයට යොමු කළ විට, එවකට පර්ක් ආයතනයේ අධ්‍යක්ෂ ජනරාල් ලීල් වික්‍රමආරච්චි වෙත අධීක්ෂණය සඳහා යොමු කර, ඉඩම් ලියාපදිංචි කිරීමට අදාල සියලු ලිපි ලේඛන පිටපත් ලබා ගැනීමට සහ විෂය කාරණාවට අදාළව ගොනුවෙහි ඔහු විසින් සිදු කළ සියලු කටයුතු සමඟ ඉහත කී පිටපත් පර්ක් ලේඛනයෙහි ගොනු කිරීමට මග පෙන්වීමි.

7. අ) තවදුරටත් පෙත්සමෙහි ඡේද 32(බී) සහ ඡේද 25,26,27,28,29,30 සහ 31 ට පිළිතුරු සපයමින්, පෙත්සම්කරු විසින් නිකුත් තබා එම ගනුදෙනුව පිළිබඳව කෝප් කමිටුව විසින් 2006.11.28 දින මා පරීක්ෂාවට ලක් කරන අතර, එම ඉඩම් පැවරුම සඳහා මාගේ එකඟත්වය පලවී තිබේ දැයි, 2004.5.28 දින මා පර්කිහි සභාපති ධූරයට පත්ව කෙටි කලකින් මා විසින් 2004.7.15 දිනැතිව මහා භාණ්ඩාගාරයේ රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වී. කණගසබාපදි වෙත යවනු ලැබූ මාගේ ලිපියේ පිටපතක් පරිශීලනය කරන ලද අතර, එබැවින් එම කාලයේදී එම කාරණය අධ්‍යයනය කර නොමැති බව, කෝප් අනුකමිටුව විසින් පැහැදිලි කර ගන්නා ලද බව, මා ප්‍රකාශ කර සිටිමි.

*2005.7.15 දිනැතිව යවනු ලැබූ එකී ලිපියේ සත්‍ය පිටපතක් , **22ආර්(5)** ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

ආ) එකී ඉඩම සිදු කිරීමට අදහස් කරනු ලැබූ පැවරීම මාගේ අනුදැනුමකින් තොරව සිදුවූ බවත්, මුද්දර ගාස්තු සිද්ධිය වූ ස්ථානයන්හි ගැවසීම අවම ලෙස සලකන ලෙසත් 2004.7.15 දිනති මාගේ ලිපියෙන් සඳහන් කර ඇති අතර, කෙසේ වෙතත්, ගරු නීතිපති එකඟතාවයට යටත්ව ද්විත්ව මාරුවක් එනම්, රජය විසින් (එවකට එකී ඉඩම රජය සතු ඉඩමක් බවට විශ්වාස කරන ලදී) ලංකා ඛනිජ තෙල් සමාගම (17 වන වගඋත්තරකාර) වෙත සහ ඉන් අනතුරුව ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව (17 වන වගඋත්තරකාර) විසින් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) වශයෙනි. එම පැවරුම සඳහා, මිලදී ගැනීම සලකා ඒ මත ගෙවිය යුතු මුද්දර ගාස්තු පිරිවැය දැරීමට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවට (17 වන වගඋත්තරකාර) සිදු විය. මම මෙම ඉඩම් මාරුව සඳහා එකඟතාවය පල කර නොමැති බවත්, මම වහාම කෝප් අනු කාරක සභාවට පැහැදිලි කළෙමි.

ඇ)මෙහි ප්‍රතිඵලයක් වශයෙන්, කෝප් අනු කමිටුවෙහි සභාපති පා.ම. ඩිලාන් පෙරේරා වෙත යොමු කරනු ලැබූ මගේ 2006.12.1 දිනැති ලිපිය මගින්, එකී කරුණ පැහැදිලි කරමින්, වෙනත් කරුණු අතර, පහත පරිදි සඳහන් කරන ලදී:

> "එසේම මාගෙන් ප්‍රශ්න කරනු ලැබූ විට, මෙම ඉඩමේ 'පැවරුම' සම්බන්ධයෙන් මා සම්පූර්ණයෙන්ම නොදන්නා බව සඳහන් කළෙමි. මම රැස්වීමේදී අන් අය ඉදිරියේ මේ

පිළිබඳ පැහැදිලි කෙළේ නැත. ආචාර්ය පී.බී. ජයසුන්දර එක් දිනක් මට දුරකතනයෙන් අමතා මෙම ඉඩම් පැවරුම වහාම සිදු වීම අවශ්‍ය බව දන්වන ලදී - 'හෙටම කරල දෙන්න'. මෙම කරුණ පරික්ෂා කිරීමකින් තොරව එසේ සිදු කිරීම මා විසින් ප්‍රතික්ෂේප කළෙමි. ඉන් අනතුරුව, මට නොදන්වා, විදුලිබල හා බලශක්ති අමාත්‍යාංශයේ එවකට ලේකම් පී. වීරහැන්නදි මහතා විසින් එම ඉඩම පැවරුම සිදු කර ඇත. ජෝන් කීල්ස් ආයතනය විසින් 2004.11.3 දිනැතිව විදුලි බල හා බල ශක්ති අමාත්‍යාංශය වෙත යොමු කරන ලද ලිපිය සහ එදිනම පී. වීරහැන්නදි මහතා විසින් අතිගරු ජනාධිපති අතිරේක ලේකම් සී. අතුරුගිරිය මහත්මිය සමඟ පැවති දුරකතන සංවාදයෙන් අනතුරුව ඇය වෙත යවනු ලැබූ ලිපිය මේ සමඟ අමුණා ඇත.

*2006.12.1 දිනැතිව යවනු ලැබූ මගේ ලිපියේ සත්‍ය පිටපතක් , **22ආර්(6)** ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

ඇ) භාණ්ඩාගාර ලේකම් පී.බී. ජයසුන්දර (8 වන වගඋත්තරකාර) මා ඇමතූ ඉහතින් සඳහන් කළ දුරකතන ඇමතු මගින් එකී ඉඩම නොපමාව පැවරීමට අවශ්‍ය බව මා වෙත දන්වා සිටි අතර, එය සිදු කළේ මා 2004.5.29 දින පර්ක් හි සභාපති ලෙස පත්වූ විගසමය.

ඉ) භාණ්ඩාගාර ලේකම් පී.බී ජයසුන්දර ( 8වන වගඋත්තරකාර), ඔහුව කෝප් විසින් පරීක්ෂා කරනු ලැබූ විට, මම මේ ඉඩම් පැවරීමට විරෝධය පාමින්, එයින් වැලකී සිටීමට පියවර ගනිමින් සිටි බැවින්, මේ කාරණය සම්බන්ධයෙන් මා අසුකොට තැබීමට උත්සාහ කර ඇති බවත් මා විසින් වටහා ගනු ලැබූ අතර, 2004.10.5 දින එවකට පර්ක්හි අධ්‍යක්ෂට එකී ඉඩම් තක්සේරු කිරීම යන කාරණය මත කටයුතු කිරීමට නියෝග කර ඇති බවත් ඒ අනුව, 2004.10.5 දිනැතිව ඩීඑෆ්සීසී බැංකුව (14 වන වගඋත්තරකාර) වෙත ලිපියක් **(පි28(බී))** යවා ඇති බවත් පෙනේ.

ඊ) ඉන් අනතුරුව ජෝන් කීල්ස් විසින් (8 වන වගඋත්තරකාර) 2004.11.3 දිනැතිව විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශය වෙත ලිපියක් යවනු ලැබ **(පි29(ඒ))**, එවකට එහි විදුලි බල හා බලශක්ති අමාත්‍යාංශ ලේකම් පී වීරහැන්නදි (9 වන වගඋත්තරකාර) එදිනම එනම් 2004.11.3 දිනැති ලිපිය (පි(20(බී)) මගින් එකී ඉඩමේ අරමුණුගත පැවරුම වහාම ආරම්භ කිරීමට කටයුතු කර ඇත්තේරජයට කිසිදු ගෙවීමක් කිරීමට සළකා බැලීමෙන් තොරව බව සැළකිය යුතු වේ. **(පි31(ඒ))** සහ **(පි31(බී))**

එ) ඩීඑෆ්සීසී බැංකුව විසින් සිදු කරනු ලැබූ තක්සේරු කිරීමෙහි පදනම කුමක්ද යන්න පිළිබඳ මා දැනුවත් නොවන අතර ඒ සමඟ එකඟ නොවන බවත්, පෙත්සමෙහි 10 සහ 11 වැනි ඡේද අනුව, නියමිත ක්‍රියාදාමයකින් තොරව එම ආයතනය තෝරා ගත්තේ කෙසේද යන්න පිළිබඳව නොදන්නා බවත් මා කෝප් වෙත දැනුම් දුනිමි.

8. අ) තවදුරටත්, පෙත්සමෙහි පරිච්ඡෙද 30 ට පිළිතුරු සපයමින්, ජෝන් කීල්ස් හි (18 වන වගඋත්තරකාර) එවකට සභාපති (21 වන වගඋත්තරකාර) වෙත යොමු කරනු ලැබූ මගේ 2005.7.1 දිනැති ලිපියෙහි (පි32(/(22ආර්1) පහත ඡේදය උපුටා දක්වමි.

> "පර්ක් විසින් සියලු රාජ්‍ය ව්‍යාපාර සම්බන්ධයෙන් සිදු කරන ලද සමස්ත පශ්චාත් පැවරුම් ඉවත් කිරීමේ සමාලෝචනය හා සමීක්ෂණ සන්දර්භය තුල, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් පැවරුම ඉවත් කර ඇති බැවින්, පශ්චාත් පැවරුම ඉවත් කිරීමේ කාලය සඳහා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි වාර්ෂික ගිණුම් සඳහා ඉල්ලීමට, ඔබ විසින් ප්‍රතිචාර දක්වා නැත. ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) හි කුමක් සඳහන්ව තිබුණ ද, එය ලැයිස්තුගත මහජන සමාගමේ අනුබද්ධ සමාගමක් වන අතර, 1982 අංක 17 දරණ සමාගම් පනත දු විධිවිධාන අනුව එහි පොදු පැවැත්ම පිළිබඳ වාර්ෂික ගිණුම් පිටපත් හිමිකම මහජනතාව සතුය. නීතිය අනුව සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) වාර්ෂික ගිණුම් පිටපත් ලබා ගැනීම මේ අනුව සිදුවේ."

ආ) එවකට උප සභාපති වූ වර්තමානයේ ජෝන් කීල්ස් හි (18 වන වගඋත්තරකාර) සභාපතිවන (20 වන වගඋත්තරකාර) සුසන්ත රත්නායක විසින්, එවකට අතිගරු ජනාධිපති ජ්‍යෙෂ්ඨ උපදේශක සහ සෙමා (SEMA) ආයතනයේ සභාපති මනෝ තිත්තවෙලගෙන්, මා සමඟ සිටි රැස්වීමක දී ලංකා මැරයින් සර්විසස්

ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) ගිණුම් සඳහා කැඳවීමට ඕනෑකමින් නොකඩවා සිට පර්ක් වැළැක්වීමට ඉල්ලා සිටින ලදී.

ඇ) එහි ප්‍රතිඵලයක් ලෙස, 1982 අංක 17 දරණ සමාගම් පනතේ ශීර්ෂ අංක 427 ප්‍රකාරව, මා විසින් පර්ක් සඳහා ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) හි ගිණුම් පිටපත් සමාගම් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුවෙන් ලබා ගතිමි.

9. අ) එහි සඳහන් නඩු කියන විෂය කරුණ, ඒකාබද්ධ ලිපි මගින් පෙන්නුම් කර ඇති පරිදි කාලය ඵලදායී නොවන ලිපි, සාකච්ඡා සහ ප්‍රයත්නයන් ප්‍රතිඵලය වන විෂයයක් බව බව තවදුරටත් පෙත්සමෙහි 20 වන ඡේදයට පිළිතුරු සපයමින්, **(පී21)**, 2004.11.18, 205.3.18, 2005.5.18, 2005.05.20, 2005.7.1 **(පී32)/(22ආර්(1)**, 2005.7.1**(22ආර්2)** සහ 2005.7.6 **(22ආර්3)** දිනැති ඇමුණුම් ලිපි මගින් ඉදිරිපත් කර ඇති සාක්ෂි සහිතව මා ප්‍රකාශ කර සිටිමි.

*2004.3.3* ***(පී21),*** *2004.11.18, 2005.3.18, 2005.5.18, 2005.5.20 දිනැතිව පිළිවෙලින්* ***22ආර්7(ඒ), 22ආර්7(බී), 22ආර්7(සී), 22ආර්7(ඩී)*** *සහ* ***22ආර්7(ඉ)*** *වශයෙන් සළකුණු කර අමුණා ඇති මගේ එකී ලිපිවල සත්‍ය පිටපත් ඉදිරිපත් කරන අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

ආ) පෙත්සමෙහි පරිච්ඡේද 20(ඉ) මගින් සම්බන්ධිත, එකී මතභේදයට තුඩුදී ඇති කාරණය 2005.8.1 දිනැති **(පී22)** ගරු අභියාචනාධිකරණයේ නියෝගයක් මගින් අවසන් කරන ලදී.

10. තවදුරටත්, පෙත්සමෙහි පරිච්ඡෙද 24 ට පිළිතුරු සපයමින්, ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) හි 90% ක් කොටස් සඳහා වන සමස්ත මිලදී ගැනීම සලකා රජය වෙත ජෝන් කීල්ස් (18 වන වගඋත්තරකාර) විසින් ගෙවූ රු. මිලියන 1200 ක් සළකා, විනාශ වන බේරුම් මත රජය විසින් ගෙවිය යුතුව තිබූ රජයට විරුද්ධව ඇ. ඩො. මිලියන 9.2 ක හිමිකම් ඉවත් කර දමා, බේරුම් කිරීම සම්බන්ධ ප්‍රයත්නයන් හා රජය වෙනුවෙන් කළ යුතු උත්සාහයන් පිළිබඳව එකී පරිච්ඡේදයෙන් සම්බන්ධිත බේරුම් කිරීමේ හිමිකම්ද පැවති බව මා ප්‍රකාශ කරමි.

11. අ) ඔබගේ ගරු අධිකරණය හමුවේ මෙම අයැදුම ඇසීමට සිටියදී, පෙත්සම්කරු විසින් නිකුත් තබා ඇති මෙම ගනුදෙනුව තුළ අනාවරණය කර ඇති පරිදි, ජෝන් කීල්ස් ආයතනය (18 වන වගඋත්තරකාර) සහ එහි සභාපති සුසන්ත රත්නායක (20 වන වගඋත්තරකාර) ඉලක්ක කිරීමට, ශ්‍රී ලංකාවේ වඩාත් ම ගෞරවයට පාත්‍ර වූ ආයතනයක් ලෙස සහ එහි සභාපති ලෙස සුසන්ත රත්නායක (20 වන වගඋත්තරකාර) තම අවංකභාවය, ආයතනික සමාජ වගකීම, ජාතික දෘෂ්ටිය තමාට පෙර රට ගැන සිතන බව යන්න පිළිබඳ ඉලක්ක කිරීමට, මාධ්‍යයන්හි ඒකාග්‍ර උත්සාහයක් පවතින බව පෙනේ.

ආ) i) ජෝන් කීල්ස් ආයතනය (18 වන වගඋත්තරකාර) වෙත ලංකා මැරයින් සර්විසස් ලිමිටඩ් (LMSL) (19 වන වගඋත්තරකාර) හි 90% ක් කොටස් ප්‍රදානය කරමින්, පර්ක් ආයතනයේ එවකට සභාපති 8 වන වගඋත්තරකාර පී. බී. ජයසුන්දර විසින් 2002.7.12 දිනැතිව ලිපියක් **(පී15(ඒ))** එවකට ජොන් කීල්ස් ආයතනයේ ( 18 වන වගඋත්තරකාර) සභාපති සුසන්ත රත්නායක (20 වන වගඋත්තරකාර) යොමු කර ඇත.

ii) මෙම ප්‍රදානය පිළිගෙන ගනුදෙනුව නිගමනය කිරීමට එකඟතාවය පල කරමින්, ජෝන් කීල්ස් ආයතනයේ (18 වන වගඋත්තරකාර) එවකට සභාපති සුසන්ත රත්නායක (20 වන වගඋත්තරකාර) විසින් **(පී16)** පර්ක් ආයතනයේ එවකට සභාපති පී. බී. ජයසුන්දර (8 වන වගඋත්තරකාර) වෙත, 2002.7.12 දිනැතිව නොපමාවම පිළිතුරු යවනු ලැබ ඇත.

iii) ජෝන් කීල්ස් ආයතනයේ (18 වන වගඋත්තරකාර) එවකට සභාපති සුසන්ත රත්නායක ( 20 වන වගඋත්තරකාර) විසින් 2002.7.31 දිනැතිව පර්ක් ආයතනයේ සභාපති වෙත ලිපියක් **(පී18(ඒ))** යොමු කළ අතර, එහි ප්‍රතිඵලයක් වන සහන කිහිපයක් සඳහා ඉල්ලා (අභියාචනාධිකරණය විසින් අභියෝගයට ලක් කරන ලද ඒකාධිකාරය ඇතුළු **(පී22))** 2002.8.2 දින ජෝන් කීල්ස් (18 වන වගඋත්තරකාර) මුණගැසුණු බව එකී ලිපියේ **(පී18(ඒ)** සඳහන් කර ඇත.

iv) එකී හමුව එම දිනයේදී පැවැත්වූ බව තහවුරු කරමින්, 2002.731 දිනැති එකී ලිපියේ(පී18(ඒ)) සඳහන් ගැටලු සඳහා එකඟතාවයන්ට එළඹි බවත්, ඒ පිළිබඳව පී.බී ජයසුන්දර ( 8 වන වගඋත්තරකාර) ට ස්තුතිය ප්‍රකාශ කරමින්, ජෝන් කීල්ස් ආයතනයේ (18 වන වගඋත්තරකාර) එවකට සභාපති සුසන්ත

රත්නායක ( 20 වන වගඋත්තරකාර) විසින් එදිනම එනම් 2002.8.2 දිනැතිව පර්ක් ආයතනයේ එවකට සභාපති පී.බී ජයසුන්දර ( 8 වන වගඋත්තරකාර) වෙත ලිපියක් යවා ඇත.

2007 අගෝස්තු මස එල්එම්ඩී(LMD) සඟරාවේ පිටකවරයෙහි සත්‍ය පිටපත සහ 2007 අගෝස්තු / සැප්තැම්බර් මාසයන්හි පුවත්පත් වල සම්පූර්ණ පිටුවක පළවූ දැන්වීමෙහි සත්‍ය පිටපත් පිළිවෙලින් ***22ආර්8(ඒ)*** *සහ* ***22ආර්8(බී)*** *ලෙස සළකුණු කර අමුණා ඇති අතර, එය මාගේ විරෝධතාවය ප්‍රකාශ කිරීමට මෙම අයැදුමෙහිම කොටසක් වශයෙන් භාර ගන්නා ලෙස අයැද සිටී.*

12. ඉහත සඳහන් පදනම තුල, පෙත්සම්කරුගේ අන්තර්ගතයන් පිළිබඳ මා සමගාමී සහ එකඟ වන බව අවධාරණය කරන අතර, ඔහුගේ පෙත්සමෙන් අයැදින සහන ඔබගේ ගරු අධිකරණයෙන් ලබා දෙන ලෙස බැගෑපත්ව අයැද සිටිමි.

ඉහත දිවුරුම් ප්‍රකාශය ප්‍රතිඥා දෙන්නා හට මා විසින් කියවා තේරුම් කර දෙන ලද අතර මෙම ප්‍රතිඥාවෙහි සඳහන් කරුණු ඔහු විසින් තේරුම් ගෙන 2007 සැප්තැම්බර් මස 7වන දින කොළඹදී මෙහි ඔහුගේ අත්සන තබන ලදී.

*(අත්සන)*
ප්‍රතිඥා දෙන්නා

*(අත්සන)*
ප්‍රසිද්ධ නොතාරිස්
ඉදිරිපිටදී

*(නිල මුද්‍රාව)*
එස්. නවරත්නම්
සාමවිනිසුරු
අංක 25/10, විපුලසේන මාවත
කොළඹ 10
007/09/07

සත්‍ය පිටපතකි

(අත්සන)
22 වන වගඋත්තරකරු වෙනුවෙන් නීතිඥ